# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2114/13 – 2019 මාර්තු මස 12 වැනි අඟහරුවාදා – 2019.03.12

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

**1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ, 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නගර සැලසුම්, ජල සම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍ය, රවුෆ් හකීම් වන මම, එකී මණ්ඩලයට ගම්පහ අත්තනගල්ල සහ මිනුවන්ගොඩ ඒකාබද්ධ ජල සම්පාදන ක්‍රමය යටතේ ජල ටැංකිය, ගබඩාව හා පොම්පාගාරය ඉදිකිරීම සඳහා ඉඩම් කොටසක් අත්කර ගැනීමට අවශ්‍ය වී ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසේ නිශ්චල දේපළ අයිතිය අත්කර ගැනීම මේ නියමයෙන් අනුමත කරමි.

**රවුෆ් හකීම්,**
නගර සැලසුම්, ජල සම්පාදන සහ
උසස් අධ්‍යාපන අමාත්‍ය.

2019 මාර්තු මස 05 වැනි දින,
අංක 35, නව පාර්ලිමේන්තු පාර,
පැලවත්ත,
බත්තරමුල්ල,
නගර සැලසුම්, ජල සම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ දී ය.
5/2/3/1445

**උපලේඛනය**

ගම්පහ දිස්ත්‍රික්කයේ, මිනුවන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, බටහිර - මිනුවන්ගොඩ ග්‍රාම නිලධාරී වසමේ බොරගොඩවත්ත ගමේ පිහිටි, ජම්බුගොඩැල්ලවත්ත නමැති ඉඩමෙන් සම්පූර්ණ ප්‍රමාණයෙන් පර්චස් 52ක් පමණ වන පහත සඳහන් මායිම් තුළ වූ ඉඩම් කොටස.


1A – G 29624 – 50 (2019/03)



*මෙම අතිවිශේෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

*උතුරට* : හිමිකරුවකු නොදන්නා හිස් ඉඩම;
*නැගෙනහිරට* : හිමිකරුවකු නොදන්නා ඉඩම;
*දකුණට* : ටෙලිකොම් සම්ප්‍රේෂණ කුළුණ හා පන්සලේ ඉඩම් කොටසක්;
*බටහිරට* : පන්සල් ඉඩම සහ නිහාල් යන අයගේ ඉඩම.

*ඉඩමට හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය :*

01. මිනුවන්ගොඩ නගර සභාව,
මිනුවන්ගොඩ.

03 – 1284

---

**1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ, 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නගර සැලසුම්, ජල සම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍ය, රවුෆ් හකීම් වන මම, එකී මණ්ඩලයට ගම්පහ අපජල බැහැර කිරීමේ ව්‍යාපෘතිය යටතේ අංක 15 අපජල පොම්පාගාරය ඉදිකිරීම සඳහා ඉඩම් කොටසක් අත්කර ගැනීමට අවශ්‍ය වී ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසේ නිශ්චල දේපළ අයිතිය අත්කර ගැනීම මේ නියමයෙන් අනුමත කරමි.

**රවුෆ් හකීම්,**
නගර සැලසුම්, ජල සම්පාදන සහ
උසස් අධ්‍යාපන අමාත්‍ය.

2019 මාර්තු මස 05 වැනි දින,
අංක 35, ලක්දිය මැදුර,
නව පාර්ලිමේන්තු පාර,
පැලවත්ත,
බත්තරමුල්ල,
නගර සැලසුම්, ජල සම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ දී ය.
5/2/3/1446

**උපලේඛනය**

ගම්පහ දිස්ත්‍රික්කයේ, ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, 232 හෙනරත්ගොඩ ග්‍රාම නිලධාරි වසමේ මීරිස්වත්ත ගමේ පිහිටි පර්චස් 2 පමණ වූ පහත සඳහන් මායිම් තුළ වූ ඉඩම් කොටස.

*උතුරට* : කොළඹ - නුවර මහා මාර්ගය හා එම කුඹුරු ඉඩමේ ඉතිරි කොටස;
*නැගෙනහිරට* : මෙම කුඹුරු ඉඩමේ ඉතිරි කොටස;
*දකුණට* : මෙම කුඹුරු ඉඩමේ ඉතිරි කොටස හා "සීන්" වෙළඳ සැල;
*බටහිරට* : "සීන්" වෙළඳ සැල හා කොළඹ - නුවර මහා මාර්ගය.

*ඉඩමට හිමිකම් කියන්නන්ගේ නම් සහ ලිපිනයන් :* සොයාගත නොහැක.

03 – 1285

**1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ, 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නගර සැලසුම්, ජල සම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍ය, රවුෆ් හකීම් වන මම, එකී මණ්ඩලයට ගම්පහ අත්තනගල්ල සහ මිනුවන්ගොඩ ඒකාබද්ධ ජල සම්පාදන ක්‍රමය යටතේ යන්ත්‍රාගාරය, ගබඩාව හා ඊට අදාළ ගොඩනැගිලි ඉදිකිරීම සඳහා ඉඩම් කොටසක් අත්කර ගැනීමට අවශ්‍ය වී ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසේ නිශ්චල දේපළ අයිතිය අත්කර ගැනීම මේ නියමයෙන් අනුමත කරමි.

**රවුෆ් හකීම්,**
නගර සැලසුම්, ජල සම්පාදන සහ
උසස් අධ්‍යාපන අමාත්‍ය.

2019 මාර්තු මස 05 වැනි දින,
අංක 35,
නව පාර්ලිමේන්තු පාර,
පැලවත්ත,
බත්තරමුල්ල,
නගර සැලසුම්, ජල සම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ දී ය.
5/2/3/1447

**උපලේඛනය**

ගම්පහ දිස්ත්‍රික්කයේ, අත්තනගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 365 - සී, කරස්නාගල - දකුණ ග්‍රාම නිලධාරි වසමේ කරස්නාගල ගමේ පිහිටි බලුදංගොල්ල වත්ත කැලේ නමැති ඉඩමෙන් සම්පූර්ණ ප්‍රමාණයෙන් අක්කර 1, රූඩ් 03, පර්චස් 34.95ක් පමණ වන පහත සඳහන් මායිම් තුළ වූ ඉඩම් කොටස.

*උතුරට* : ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට අයත් ප්‍රවේශ මාර්ගය;
*නැගෙනහිරට* : සුසාන භූමි ප්‍රවේශ මාර්ගය;
*දකුණට* : සුසාන භූමි ප්‍රවේශ මාර්ගය හා තුන්ඕකිඳ මාර්ගය;
*බටහිරට* : කරස්නාගල තුන්ඕකිඳ මාර්ගය.

*ඉඩමට හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය :*

1. විල්බට් අමරසිංහ මයා,
   කරස්නාගල,
   අලවල.

03 – 1286